## කැනඩාවේ ආරක්ෂාවට තර්ජනයක් නිසා වීසා දෙන්න බෑ

### -සී. මැක්කින්නි - පළමු ලේකම් - ආගමන

## හාස්‍ය උපදවන චෝදනාවක්

### -වික්‍රමබාහු

හේතුසහගත පදනම් මත ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න කැනඩාවේ පවතින ආගමන හා සරණාගතයන් ආරක්ෂා කිරීමේ පනතේ 34(1)(f) මගින් විස්තර කර ඇති, කැනඩාවට ඇතුළු වීමට ඉඩ නොදිය යුතු පුද්ගලයන්ගේ පංතියට ඇතුලත් වන බවත්, ඒ අනුව වික්‍රමබාහු කරුණාරත්න 1. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවලට හා ආයතනයන්ට විරුද්ධව කටයුතු කරන්නෙකු, 2. ඕනෑම ආණ්ඩුවකට විරුද්ධව ත්‍රස්ත බලය යෙදීම සඳහා මැදිහත් වන්නකු හා එවන් ක්‍රියා වලට අනුග්‍රහය දක්වන්නකු, 3. ත්‍රස්ත ක්‍රියාවන්හි යෙදී සිටින්නෙකු, 4. කැනඩාවේ ආරක්ෂාවට තර්ජනයක් වන්නකු, 5. කැනඩාවේ වෙසෙන පුද්ගලයන්ගේ ජීවිත ආරක්ෂාවට තර්ජනයක් විය හැක්කකු බවත්, 6. එවැනි කටයුතු වල යෙදෙන සංවිධානයක සාමාජිකයෙක් ව සිටින බව පිළිගැනීමට හේතුසහගත සාධක පවතින බවත්, සැප්තැම්බර් 18 වැනිදා දාතමින් යුත් ලිපියක් මගින් කැනඩා තානාපති කාර්යාලයේ පළමු ආගමන ලේකම් සී. මැක්කින්නි ගේ අත්සනින් යුතුව ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න වෙත එවා ඇති ලිපියක සඳහන් වෙයි. ඔහු එම ලිපිය ලියා එවා ඇත්තේ කැනඩාවේ පැවැති යුධ විරෝධී රැස්වීමකට සහභාගී වීම සඳහා ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න විසින් ඉදිරිපත් කර තිබූ වීසා අයදුම් පත ප්‍රතික්ෂේප කරමිනි.

එම ලිපිය තමදුරටත් කියා ඇත්තේ, වික්‍රමබාහු කරුණාරත්න මැඩ්රීඩ් හා ලන්ඩන් නගර වල පැවැති පොංගු ටැමිල් උත්සවවලට සහභාගී වෙමින්, විමුක්ති කොටි සංවිධානයේ කටයුතු වලට විවෘතවම සම්බන්ධව සිටින බවට වාර්තා වී ඇති බවත්, එමෙන්ම බී. නඩේසන් නැමැත්තාට සහයෝගය පළ කරමින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර ඇති බවත්, ඓතිහාසිකවත්, අඛණ්ඩවත් LTTE යට සහයෝගය දක්වන්නා වූ දේශපාලන පක්ෂයක මුල් පෙළේ සාමාජිකයෙකු ලෙස ගන්නා කළ ඔහු LTTE යේ සාමාජිකයෙකු බවට නිගමනය කිරීමට සිදුවන බවත් ය. එමෙන්ම එම සංවිධානයේ පවතින ඔබගේ සාමාජිකත්වය හේතුවෙන් ඔබ කැනඩාවට ඇතුල් නොකර ගත යුත්තකු ලෙස සලකා ඔබගේ අයදුම් පත ප්‍රතික්ෂේප කරන බවත් එම ලිපියේ අවසාන වශයෙන් සඳහන්ව ඇත.

මේ සම්බන්ධයෙන් මෙම කැනඩා තානාපති කාර්යාලයේ පළමු ලේකම් - ආගමන -සී. මැක්කින්නි වෙත පිළිතුරක් යවන ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න එහි මෙසේ සඳහන් කර ඇත.

"...ඔබගේ 18. සැප්තැම්බර් 2008 දාතමින් මා වෙත ලැබුණු, මහත් විනෝදයක් දනවන ලිපිය සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමි.

පළමු කොටම ඔබගේ ලිපියට ඇතුලත් කර ඇති මුලුමනින්ම අසත්‍ය වූ දේ නිවැරදි කිරීමට ඉඩ දෙන්න. මා කිසිදා ස්පාඤ්ඤයට ගොස් නැත. එමෙන්ම මට ලන්ඩන් නගරයේ පැවැති පොංගු ටැමිල් ව්‍යාපාරයට සහභාගී වීමට අවස්ථාව නොලැබිණි. එයට හේතු වූයේ බ්‍රිතාන්‍ය වීසා ඔවුහු මට ලබා දුන්නේ එම කටයුත්ත හමාර වූ පසුව බැවිනි.

දෙවනුව, LTTE ය තම අරගලය සඳහා ත්‍රස්ත ක්‍රම පාවිච්චි කර ගන්නා වූ දෙමළ ජාතිකවාදී ධනපති පක්ෂයක් වන අතර, අපගේ පක්ෂය බහු ජන අරගලයන් පිළිබඳව විශ්වාසය තබන්නා වූ සමාජවාදී පක්ෂයකි. දේශපාලන විද්‍යාව පිළිබඳව ලේෂ මාත්‍ර වූ දැනුමක් වත් වේ නම් මා නව සම සමාජ පක්ෂයේ නායකයා වන අතරවාරයේම විමුක්ති කොටි සංවිධානයේ සාමාජිකයෙකුද විය නොහැකි බව ඔබට පෙනී යනු ඇත. ඇත්ත වශයෙන්ම අපි දෙමළ ජනතාවගේ ස්වයංතීරණ අයිතියත්, දෙමළ නිජබිමට ස්වපාලන අයිතියත් 1974 සිටම ආරක්ෂා කර ඇත්තෙමු. ඒ එසේ තිබියදීම LTTE ය අපගේ පක්ෂ සාමාජිකයන්ට විරුද්ධව ත්‍රස්තය පාවිච්චි කළේය. එම තත්වයන්ද නොතකමින් දෙමළ ජනතාවගේ මානව අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීම් මත පොදු පෙළපාලි වලට විමුක්ති කොටි සංවිධානයේ ආධාර කරුවන් සමඟද අපි සහභාගී වී ඇත්තෙමු. කෙසේ වෙතත් අප විසින් මේ සෑම අවස්ථාවකදීම සිය කැමැත්තෙන් ගොඩ නැගෙන සිංහල හා දෙමළ ජාතිකත්වයන්ගේ එක්සත්භාවය වෙනුවෙන් පෙනී සිටියෙමු.

තුන්වෙනුව, මා LTTE යේ සාමාජිකයෙකුව සිටින බවට ඔබ වෙත කුමන හෝ විශ්වාස කටයුතු සාක්ෂියක් වේ නම් එම දන්නා දේවල් මහින්ද පාලනතන්ත්‍රය සමඟ ඔබ බෙදාහදා ගන්නා බව මට සහතිකය. නමුත් මේ වන තෙක් ආණ්ඩුව කිසිම පියවරක් නොගැනීම විමතියට කරුණකි. ඉන් පෙනෙන්නේ ඔබගේ හාස්‍යජනක චෝදනාව මේ ජාතිවාදී, යුධවාදී ආණ්ඩුවවත් බරපතල ලෙස නොගන්නා බවයි.

අවසාන වශයෙන් ඔබ වෙත ප්‍රජාතන්ත්‍රවාදී වම ගැන බිඳක හෝ හැඟීමක් ඉතිරිව ඇත්තේ නම්, ඔබගේ වගකීම් විරහිත, බියකරු නිගමනයන්ට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට මා වෙත අයිතියක් තිබේ දැයි දන ගැනීමට සලස්වන්න..........."